Department of Education, Sabaragamuwa Province/ Weekly School Department of Education, Sabaragamuwa Province/ Weekly School

# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සබරගමුව

## සති පාසල

**විෂය - පෙරදිග සංගීතය**

**ශ්‍රේණිය - 9**

**සැප්තැම්බර් මාසය -3 සතිය**

සැකසුම - ගයානි චන්ද්‍රකාන්ති
ර/නිවි/ඇලපාත මහා විද්‍යාලය

**නිපුණතාව 1.0 :** සංගීතයේ මූලිකාංග, ශිල්පාංග හා සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන/වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1:** ආරෝහණයේ සහ අවරෝහණයේ විවිධ ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් ගායන හැකියා වර්ධනය කර ගනියි.

**ක්‍රියාකාරකම 1.1.1 :** <u>කාෆි රාගයේ මධ්‍යලය ගීතය</u>

ඉහත 1.1.1 ක්‍රියාකාරකමට අදාළ ව සපයා ඇති අංක 01, 02 හා ,03 පැවරුම් සම්පූර්ණ කරන්න.

<u>පැවරුම 01</u>

i. කාෆි රාගයට අයත් පහත සඳහන් මධ්‍යලය ගීත ගායනය හොඳින් ශ්‍රවණය කරන්න. ඛ්‍යාල් ගායනා ශෛලිය පිළිබඳ මෙන් ම ඒවා ගයන පිළිවෙළ පිළිබඳව ද අවබෝධයක් එමගින් ලැබේ.

https://youtu.be/6Za28rFy2Mo

ii. මෙම ගීතය ශ්‍රවණය කිරීමේ දී විශේෂයෙන් කාෆි රාග අංග පිළිබඳ ඔබේ අවධානය යොමු කරන්න.

iii. කාෆි රාගයට අයත් මධ්‍යලය ගීතය පහත ඇක්වෙන අයුරින් නිවැරදිව අභ්‍යාස පොතේ සටහන් කර ගන්න.

iv. හැකි නම් ස්වර පුවරුවක් ආධාරයෙන් හෝ ඉහතින් ඔබට ලබා දී ඇති link ආධාරයෙන් නාදමාලාව තහවුරු වන තෙක් ඉතා හොඳින් මෙම ගීතය ගායනයට හුරු වන්න.

<u>කාෆි රාගය - මධ්‍යලය ගීතය - ත්‍රි තාලය</u>



<u>පැවරුම 02 (ලිඛිත)</u>

i. කාෆි රාගයට අයත් රාග විස්තරය ලියා දක්වන්න.(මේලය,ජාතිය,වාදී,සංවාදී, මුඛ්‍යාංගය,ගානසමය සහිත ව)

<u>පැවරුම 03</u>

i. e තක්සලාව, e නැණපියස වෙබ් අඩවි හරහා හෝ අන්තර්ජාලයේ ඇතුළත් කාෆි රාගයට අයත් ශාස්ත්‍රීය ගායන වාදන පරිශීලනයට යොමුවන්න. *<u>නිර්දේශිත මධ්‍යලය ගීත</u> - සැපරිසි දී නෙක/සඳරැස් ගලා යේ බොහෝ සේ/සුරපති කන්ද කුමාර ස්වාමී/ අහසේමිණි බැබලේ/ ප්‍රභූ තෙරී දයා හෙ අපා/ චංඩෝ චංඩෝ වෛලා මෝරි හෙයා*